ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
இலங்கை ஏற்றுமதி அபிவிருத்தி சபை
SRI LANKA EXPORT DEVELOPMENT BOARD

Ministry of Development Strategies & International Trade

# 2020 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය වෙත 2020 වර්ෂය සඳහා පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීම සඳහා ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන නිෂ්පාදකයින්, ඒජන්තවරුන්, බෙදාහරින්නන්, ආනයනකරුවන්, බලයලත් අලෙවිකරුවන්, තොග වෙළඳ ආයතන, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ සේවා සපයන්නන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. කාර්යාල උපකරණ හා ලිපි ද්‍රව්‍ය

1.1 පෑන්, පැන්සල්, ලිපිකවර, ස්ටේපල්, යතුරුලියන කඩදාසි, ඡායාපිටපත් කඩදාසි, කැල්කියුලේටර් සහ පිස්නා ආදිය
1.2 පරිගණක සහ අනු අයිතම , පරිගණක දෘඩාංග සහ පරිගණක උපාංග, යූපීඑස්, මවුස්, කී බෝඩ්, ආදිය, සර්වර්ස්, ගබඩා, පරිගණක, ලැප්ටොප්, ටැබ්, මොනිටර්, විදුලි අනුවර්තක, ස්කෑනර් ආදිය , මුද්‍රණ යන්ත්‍ර හා මුද්‍රණ යන්ත්‍ර උපාංග, ඩොට්මෙට්රික්ස්, ලේසර්ජෙට් ප්‍රින්ටර්, කලර් ප්‍රින්ටර්, ෆොටෝ කන්ඩක්ටර් ආදිය
1.3 යතුරුලියන, ෆැක්ස් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, එකතුකිරීමේ යන්ත්‍ර, පැමිණීම සටහන් කිරීමේ යන්ත්‍ර, මුහුණු සහ ඇඟිලි සටහන් සහ වෙනත් උපකරණ ආදිය
1.4 තොරතුරු තාක්ෂණ ජාලකරණ විසඳුම්, පරිගණක පාරිභෝගික භාණ්ඩ (ප්‍රින්ටර් ටෝනර්, කාට්රේජස්, රිබන්, පෙන්ඩ්‍රයිව්, සංයුක්ත තැටි : Recordable CDs, DVDs, ඩිස්කට්ස් ආදිය)
1.5 විදුලි උපකරණ සහ අමතර කොටස් (ශීතකරණ, විදුලි පංකා, වායු සමීකරණ යනාදිය)
1.6 ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ සහ සන්නිවේදන උපකරණ (කැමරා, වීඩියෝ කැමරා, ප්‍රොජෙක්ටර් සහ ප්‍රොසෙසින් යන්ත්‍ර, සේයාපටල, ප්ලේට් රෝල්, ගුවන් විදුලි යන්ත්‍ර, කැසට්, දුරකථන පද්ධති සහ දුරකථන උපාංග ආදිය
1.7 කාර්යාලීය ගෘහ භාණ්ඩ – දැව සහ වානේ (කැබිනට්, අල්මාරි රාක්ක : Shelves මේස, පුටු ආදිය)
1.8 දින මුද්‍ර, රබර් මුද්‍ර, නාම පුවරු (ඇළුමිනියම් / ප්ලාස්ටික්, පිත්තල ආදිය)
1.9 නිල ඇඳුම් රෙදි (කමිස රෙදි, කලිසම් රෙදි, සපත්තු සහ මේස්, සාරි)

## 2. කාර්යාල උපකරණ අලුත්වැඩියා හා නඩත්තු කිරීම

2.1 කාර්යාලීය උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව (යතුරුලියන, කැල්කියුලේටර්, ෆැක්ස් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, එකතු කිරීමේ යන්ත්‍ර, පැමිණීම සටහන් කිරීමේ යන්ත්‍ර (මුහුණු සහ ඇඟිලි සටහන්) සහ වෙනත් උපකරණ ආදිය)
2.2 වායුසමීකරණ අලුත්වැඩියාව සහ සේවා කිරීම
2.3 පරිගණක, ප්‍රින්ටර්, පරිගණක සර්වර් අලුත්වැඩියාව සහ නඩත්තුව
2.4 කාර්යාල ගෘහ භාණ්ඩ (දැව/වානේ) අලුත්වැඩියාව
2.5 යතුරු කැපීම සහ ලොක් අලුත්වැඩියාව

## 3. මෝටර් වාහන හා සැහැල්ලු වාහන අලුත්වැඩියාව සහ අමතර කොටස් සැපයීම

3.1 සැහැල්ලු වාහන සඳහා ටයර්, ටියුබ් සහ බැටරි
3.2 සැහැල්ලු වාහන සහ මෝටර්සයිකල් සඳහා අමතර කොටස්
3.3 සයිලන්සර්, රේඩියේටර්, මෝටර් වාහන වායුසමීකරණ අලුත්වැඩියාව
3.4 වාහන අප්හෝස්ටරි වැඩ (වාහන සීට් කුෂන්, සීට් කවර, රබර් කාපට් සහ කැන්වස් කවර)
3.5 වාහන සේවා (15 කිලෝමීටර් ඇතුළත, කාර් සේදීම, කාපට් ෂැම්පූකරණය, ඇතුළත පිරිසිදු කිරීම)
3.6 වීල් එලයින්මන්ට්ස් සහ ඇජෙස්මන්ට්ස්
3.7 වාහන විදුලි අලුත්වැඩියාවන්
3.8 මෝටර් වාහන ටින්කරිං හා පින්තාරු කිරීම
3.9 මෝටර් වාහන අලුත්වැඩියාවන්

## 4. දැන්වීම් කටයුතු , ප්‍රචාරණ වැඩ සහ මුද්‍රණ කටයුතු

4.1 ප්‍රචාරණය හා පිටත ප්‍රචාරණය (බැනර්, අත් පත්‍රිකා, LED පැනල, නාම පුවරු, පෝස්ටර් යනාදිය)
4.2 ශ්‍රව්‍ය දෘෂ්‍ය වාර්තා චිත්‍රපට නිෂ්පාදනය
4.3 ඇඳීම් වැඩ ඩිසයින් කිරීම, සඟරා පොත් පිංච, පෝස්ටර්, ආරාධනා/සුභ පැතුම් කාඩ් යනාදිය සැලසුම් කිරීම සහ මුද්‍රණය (දේශීය/විදේශීය)
4.4 ප්‍රදර්ශන/සම්මන්ත්‍ර/වැඩමුළු සඳහා ශබ්ද පද්ධති (මයික්‍රොෆෝන්, රෙකෝඩින් පහසුකම්, ස්පීකර්ස් ආදිය)
4.5 කාර්යාල ලේඛන, රිසිට් පොත් යනාදිය මුද්‍රණය
4.6 මුද්‍රණ/පොත් බැඳීම (පොත් පිංච, පත්‍රිකා, බැනර් සහ පෝස්ටර්)
4.7 සන්නාමකරණය (ආයතනික / වෙළඳ නියෝජිත සන්නාමකරණය)
4.8 ප්‍රවර්ධන අයිතම (කුසලාන, ඵලක, පදක්කම්, ටී ෂර්ට්, බෑග්, ත්‍යාග යනාදිය)

## 5. වෙනත් සේවාවන්

5.1 සිද්ධි කළමනාකරුවන්/දේශීය හා විදේශීය වෙළඳ ප්‍රදර්ශන සංවිධානය
5.2 විද්‍යුත් වාණිජ්‍ය (විද්‍යුත් ව්‍යාපාර, විද්‍යුත් ගෙවීම් පහසුකම්, විද්‍යුත් අලෙවිකරණ පහසුකම් ආදිය)
5.3 වෙළඳ කුටි ස්ථාපනය හා නඩත්තුව (නිර්මාණකරණය, ස්ථාපනය හා නඩත්තුව)
5.4 භාෂා පරිවර්තකයින් (ඉංග්‍රීසියෙන් දෙමළට, ජපන්, චීන සහ අනෙකුත් විදේශ භාෂාවන්)
5.5 කාර්යාල ආරක්ෂක සේවාවන්
5.6 කාර්යාල අංශ වෙන් කිරීම්, නවීකරණය, අභ්‍යන්තර සැලසුම් කිරීම් : Interior Designing - සහ ඉදිකිරීම් (පින්තාරු කිරීම, පිරිසැකසුම් කිරීම ආදිය)
5.7 විදුලි හා දුරකථන රැහැන් ඇදීම (සර්කිට්බ්‍රේකර්ස්, බල්බ, ස්විච් බෝඩ් ආදිය)
5.8 ගොඩනැගිලි/ප්‍රදර්ශන ශාලා ආලෝකකරණය
5.9 කාර්යාල ප්‍රවාහන සේවා, මෝටර් වාහන කුලී පදනම මත (කාර්, වෑන්, බස් යනාදිය)
5.10 මෘදුකාංග විසඳුම් සපයන්නන් (මෙහෙයුම් පද්ධති, මෘදුකාංග බලපත්‍ර, ඩේටාබේස්, ඇප්ලිකේෂන් මෘදුකාංග, බිස්නස් ඉන්ටලිජන්ස්, වර්ක් ෆ්ලෝ සොලූයුෂන්ස්, අයි ටී ආරක්ෂණ විසඳුම්, ක්ලව්ඩ්සොලූයුෂන් ආදිය)
5.11 අන්තර්ජාල පහසුකම්, බ්‍රෝඩ්බෑන්ඩ් සේවා, ජංගම විසඳුම්
5.12 භාණ්ඩ ප්‍රවාහනය කරන්නන් – ගුවන්, මුහුදු හා කුරියර් සේවා (දේශීය හා අන්තර්ජාතික)
5.13 නවාතැන් පහසුකම් (වැඩමුළු, ප්‍රදර්ශන සඳහා සහභාගී වන්නන් සඳහා දේශීය හා විදේශීය නවාතැන් පහසුකම්)
5.14 ශ්‍රවනාගාර සහ ඉඩ පහසුකම් (ප්‍රදර්ශන ස්ථාන, ශාලා පහසුකම්)
5.15 රංගකලාව (දේශීය හා ජාත්‍යන්තර ප්‍රදර්ශන සඳහා නැටුම් කණ්ඩායම් සහ වෙනත් කලා කණ්ඩායම්)
5.16 කෘමි පාලනය
5.17 උපදේශන සේවා
5.18 තේ කොළ, කිරි පිටි, සීනි, බෙහෙත්, ටිෂූ අත් පිස්නා, බෝතල් කළ පානීය ජල සැපයුම ආදිය
5.19 ආහාර පාන (විශේෂ අවස්ථා, වැඩමුළු, ප්‍රදර්ශන සඳහා උදෑසන, දහවල්, සවස, රාත්‍රී ආහාර පාන)
5.20 හැඳුනුම් පත් සැකසීම
5.21 දුරකථන හා උපකරණ

## අයදුම්පත් යොමු කළ යුතු ආකාරය

➢ සියලුම සැපයුම්කරුවන් ව්‍යාපාර ලියාපදිංචි සහතිකය, සමාගමේ විස්තර, බැංකු විස්තර, ග්‍රාම නිලධාරි සහතිකවල පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

➢ ලියාපදිංචි කිරීම, තක්සේරු කිරීමේ/ඇගයීමේ ක්‍රියා පටිපාටියට යටත්ව සළකා බලනු ලබන අතර, ලබා දෙන ලද තොරතුරු වැරදි හෝ දෝෂ සහගත බව සොයා ගනු ලැබුවේ නම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

➢ සියලුම අයදුම්කරුවන්ට භාණ්ඩ හා සේවා සැපයුම්කරු ලෙස අවම වශයෙන් වසර 02ක පළපුරුද්ද තිබිය යුතු අතර වර්තමාන සේවා දායක පදනමේ යොමු ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතුය.

➢ සැපයුම්කරුවන් විසින් අවම දින 30ක ණය කාලයක් ලබා දීමට එකඟ විය යුතුය.

➢ 2020 වර්ෂය සඳහා එක් එක් අයිතමය වෙනුවෙන් රු. 500/– ක ආපසු නොගෙවන ලියාපදිංචි වීමේ ගාස්තුවක් ගෙවිය යුතු අතර, අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ මුදල් අයකැමි වෙත මෙය මුදලින් හෝ අපනයන සංවර්ධන මණ්ඩලයේ නමට ලියන ලද චෙක්පතක් මගින් ගෙවීම් කළ හැක.

➢ අවසන් දිනය සපුරාලීමට, අපේක්ෂිත මට්ටම සහ ප්‍රමිති පවත්වා ගැනීමට අසමත් වන ලියාපදිංචි සැපයුම්කරුවන් අසාධු ලේඛන ගත කර සමාගමේ සැපයුම්කාර ලැයිස්තුවෙන් ඉවත් කරනු ලැබේ.

➢ හානි වූ හෝ දුර්වල තත්වයේ අයිතම ආපසු භාර දෙන අතර ඒවා හැකි ඉක්මනින් ප්‍රතිස්ථාපනය කළ යුතුය.

➢ ආදර්ශ අයදුම්පත් අපගේ වෙබ් අඩවිය www.srilankabusiness.com වෙත පිවිස "Announcements"යටතේ ලබා ගත හැක.

➢ සැපයීම් සහ සේවා ලබා ගැනීමේ දී ලියාපදිංචි සැපයුම්කරුවන් / සේවා සපයන්නන්ගෙන් මිල ගණන් කැඳවීම සිදු කරනු ලබයි.

➢ අවශ්‍යතාවය අනුව ලියාපදිංචි නොවූ වෙනත් සැපයුම්කරුවන් / සේවා සපයන්නන්ගෙන් ද මිල ගණන් කැඳවීම හා සැපයුම් හා සේවා ලබා ගැනීමේ අයිතිය ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සතුය.

➢ මුදල් ගෙවූ කුවිතාන්සිය/ චෙක්පත ඉල්ලුම් පත්‍රය සමග අමුණා "**2020 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම**"යනුවෙන් ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ සලකුණු කොට 2019 නොවැම්බර් 30 වන දිනට පෙර ලැබෙන පරිදි, **සභාපති හා ප්‍රධාන විධායක, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, NDB – EDB ගොඩනැගිල්ල, අංක 42, නවම් මාවත, කොළඹ 02** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් භාරදීම කළ යුතුය.

➢ වැඩිදුර විස්තර දුරකථන අංක: 011 2300702 ඔස්සේ කණිෂ්ඨ කළමනාකරු/ප්‍රසම්පාදන මගින් ලබා ගත හැක.


**සභාපති සහ ප්‍රධාන විධායක,**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**
**NDB – EDB ගොඩනැගිල්ල, අංක 42, නවම් මාවත, කොළඹ 02.**

**දුරකථන: 011-2300705-11 ෆැක්ස්: 011-2300715**
**වෙබ් අඩවිය: www.srilankabusiness.com**